මගේ අංකය : JSC/SEC/CIR-L/2024

**අධිකරණ සේවා කොමිෂන් සභා චක්‍රලේඛ ලිපි අංක : 16/2024**

**සියලුම විනිශ්චයකාරවරුන් වෙත,**

<u>බන්ධනාගාර ගතවන තරුණ වැරදිකරුවන්ගේ අධ්‍යාපන අවස්ථා ඉහළ නැංවීම</u>

ශීර්ෂගත කරුණට අදාළව අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් අධිකරණ අමාත්‍යාංශයේ ලේකම් අමතා ඇති 2024.05.30 දිනැති ලිපිය හා සබැඳිව විනිශ්චයකාරවරුන් දැනුවත් කරන ලෙසට ඉල්ලා සිටිමින් අධිකරණ අමාත්‍යාංශයේ අතිරේක ලේකම්, පියුමන්ති පීරිස් මහත්මිය විසින් අධිකරණ සේවා කොමිෂන් සභාවට පිටපතක් ද සහිතව අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා විනිශ්චයකාරවරුන්ගේ ආයතනය වෙත යොමු කර ඇති 2024.06.24 දිනැති ලිපිය පිළිබඳව සලකා බැලූ අධිකරණ සේවා කොමිෂන් සභාව, අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් යොමු කරන ලද 2024.05.30 දිනැති ලිපිය අධිකරණ සේවා කොමිෂන් සභාවේ වෙබ් අඩවියේ පළ කොට සියලුම විනිශ්චයකාරවරුන්ගේ අවධානයට ලක් කරන ලෙසට මට නියම කර ඇත. ඒ අනුව එම ලිපි මේ සමඟ අමුණා ඔබගේ අවධානයට ලක් කරමි.

අධිකරණ සේවා කොමිෂන් සභාවේ අණ පරිදි,

එච්. එස්. සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව

එච්. සංජීව සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව
කොළඹ 12

2024 ජූලි මස 11 වෙනි දින,
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේදීය.

M-01

ලේකම් / செயலாளர் / Secretary
දුරකථනය / தொலைபேசி / Telephone 2449959
ෆැක්ස් අංකය / பெக்ஸ் இல. / Fax No. 2445447
E-Mail: secretary@moj.gov.lk

ප්‍රධාන කාර්යාලය / பொது அலுவலகம் / General Office
දුරකථනය / தொலைபேசி / Telephone 2323022
ෆැක්ස් අංකය / பெக்ஸ் இல. / Fax No. 2320785
Web Site: www.moj.gov.lk

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය

நீதி, சிறைச்சாலை அலுவல்கள் மற்றும்அரசியலமைப்பு மறுசீரமைப்பு அமைச்சு

Ministry of Justice, Prison Affairs and Constitutional Reforms

තැ.පෙ. / தபால்பெட்டி / P.O. Box. 555
ඉලෙක්ට්‍රෝනික තැපැල / மின்அஞ்சல் / E-mail info@moj.gov.lk

නො 19, ශ්‍රී සංඝරාජ මාවත
කොළඹ 10
இல19, ஸ்ரீசங்கராஜ மாவத்த
கொழும்பு 10
No 19, Sri Sangaraja Mw
Colombo 10

මගේ අංකය / எனது இல / My No. MOJ/L/2/A -16/Vol.(II)

ඔබේ අංකය / உமது. இல. / Your No.

දිනය / திகதி / Date 2024.06. 24

JUDICIAL SERVICE COMMISSION COLOMBO 12
B/17
25 JUN 2024

අධ්‍යක්ෂක
ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය
අධිකරණ මාවත
කොළඹ - 12

<u>බන්ධනාගාර ගතවන තරුණ වැරදිකරුවන්ගේ අධ්‍යාපන අවස්ථා ඉහළ නැංවීම.</u>

උක්ත කරුණට අදාලව අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් විසින් මෙම අමාත්‍යාංශය වෙත යොමුකර ඇති අංක ED/9/18/15/01හා 2024.05.30 දිනැති ලිපියේ පිටපතක් ඔබගේ අවධානය යොමුකරන අතර, මේ සම්බන්ධයෙන් අදාල විනිසුරුවරු දැනුවත් කරන්නේනම් මැනවි.

පියුමන්ති පීරිස්
අතිරේක ලේකම් (නීති)
ලේකම් වෙනුවට
අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය.

පිටපත්:-

01. ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය - අංක ED/9/18/15/01 හා 2024.05.30 දිනැති ලිපියට අනුව කාරුණික දැන ගැනීම සඳහා.

02. ලේකම්, අධිකරණ සේවා කොමිෂන් සභාව - අවශ්‍ය කටයුතු සඳහා ලිපියේ පිටපතක් අමුණා ඇත.

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
இசுருபாய, பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 | +94112785818
info@moe.gov.lk | www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref.: ED/9/18/15/01

ඔබේ යොමුව / உமது இல. / Your Ref.:

දිනය / திகதி / Date: 2024.05.30

Prison Affairs Division
Ministry of Justice, Prison Affairs & Constitutional Reforms
18 JUN 2024

ලේකම්,
අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
19, ශ්‍රී සංඝරාජ මාවත,
කොළඹ 10.

**බන්ධනාගාර ගතවන තරුණ වැරදිකරුවන්ගේ අධ්‍යාපන අවස්ථා ඉහළ නැංවීම.**

විවිධ වැරදිවලට අධිකරණ නියෝග මත බන්ධනාගාර ගතවන විශාල තරුණ පිරිසක් සිටින බවට අනාවරණ වී ඇත. මෙම තරුණ පිරිස් වැරදි සඳහා යොමු වීමට පුද්ගල බද්ධ සාධක මෙන් ම සමාජ සාධක සහ පවුල පදනම් වූ සාධක ඍජු ලෙස ම බලපානු ඇත. එහි සමාජ සාධකවලදී අප සියලු දෙනා ද එහි කොටස්කාරයන් වන බැවින් අපි සියලු දෙනා ද තරුණ පිරිස්වල නොමග යාමට වගකිව යුතු වන්නේ ය. එබැවින් නැවත එවන් වැරදි ක්‍රියාවලට යොමු නොවන යහපත් පුරුවැසියකු හා ශ්‍රමබලකායේ සාමාජිකයකු ලෙස සමාජගත කිරීමට පියවර ගැනීම අප සැමගේ වගකීමක් ලෙස වන්නේ ය.

ඒ අනුව බන්ධනාගාර ගතවන තරුණ වැරදිකරුවන්ට අ.පො.ස (සා.පෙළ) හා අ.පො.ස (උ.පෙළ) විභාගයන් සඳහා පෙනී සිටිමින් ඔවුන්ගේ අනාගතය සාර්ථක කරගැනීමට අවස්ථා සැලසීම උදෙසා අධ්‍යාපන අමාත්‍යාංශය හා බන්ධනාගාර පුනරුත්ථාපන අමාත්‍යාංශයේ එකඟතාවය අනුව 2014 වර්ෂයේ දී "සුනීත" ජාතික පාසල හෝමාගම වටරැක එළිමහන් සිරකඳවුරු භූමියේ දී ආරම්භ කරනු ලදි.

ප්‍රධාන ශාලාව සහිත පන්තිකාමර ගොඩනැගිල්ල, පරිපාලන අංශය, විද්‍යාගාරය, පරිගණක විද්‍යාගාරය, භාෂා විද්‍යාගාරය ඇතුළු නවීන පහසුකම් සහිත මහින්දෝදය විද්‍යාගාර දෙමහල් ගොඩනැගිල්ල ද එම විද්‍යාගාරවලට අවශ්‍ය පරිගණක සහ නව උපාංග රැසක් ද මෙම පාසල සතුව පවතී. ඒට අමතරව විදුහල්ප [illegible] ශ්‍ය ගුරුවරුන් මෙම පාසලට [illegible] පාසල විවෘත කළ වර්ෂයේදී තරුණයින් 80කට වැඩි පිරිසක් පාසලට ඇතුළත් වී අධ්‍යාපනය ලැබූ අතර පසුකාලීනව ක්‍රමයෙන් සිසුන් අඩු විය. එයට ප්‍රධාන හේතුව වී ඇත්තේ අධිකරණය මඟින් මෙම සිරකඳවුරට තරුණයින් යොමු නොකිරීමයි.

පසුගිය වර්ෂවල අ.පො.ස (සා.පෙළ) සහ අ.පො.ස. (උ.පෙළ) විභාග සඳහා ළමයින් සූදානම් කර විභාගයට යොමු කළ අතර. ඉහළ ප්‍රතිඵල පෙන්වූ අවස්ථා රැසක් පවතී. එමඟින්, ඔවුන්ට අ.පො.ස (සා.පෙළ) සහ අ.පො.ස. (උ.පෙළ) සහතිකය අතැතිව බන්ධනාගාරයෙන් නිදහස්ව යා හැකි ය. එය ඔවුන්ට රැකියාවක් ලබාගැනීමට, විදේශගතවීමට මෙන්ම පෞද්ගලික ජීවිතයේ සාර්ථකත්වයට ද මහත් සේ උපකාරී වේ. එලෙස මෙම විද්‍යාලයේ ඉගෙනුම ලැබ විභාග සමත්ව රැකියාවල නිරත තරුණ පිරිස් මේ වන විට සිටී. ඒට අමතරව ක්‍රීඩා, සෞන්දර්ය, ආගමික, ආකල්ප සංවර්ධන වැඩසටහන් සහ නොවිධිමත් අධ්‍යාපනය යටතේ වෘත්තීය පාඨමාලා යටතේ මෙම තරුණ කණ්ඩායමෙහි ජීවන තත්ත්වය ඉහළ නැංවීමට මෙම පාසල මඟින් කටයුතු කරනු ඇත.

එහෙත්, වර්තමානය වන විට පාසලේ ශිෂ්‍ය සංඛ්‍යාව 9ක් වන අතර එය බන්ධනාගාර ගත වූවන්ගේ පහළයාමක් නිසා සිදුවූවක් නොව අධිකරණය මඟින් මෙම පාසලට ළමයින් යොමු නොකිරීම මත සිදු වූවක් වේ. එනම් අනෙකුත් බන්ධනාගාරවල වයස අවුරුදු 16 -26 අතර විශාල තරුණ පිරිස් රැදී සිටින බව වාර්තා වේ. මෙලෙස ඉතා අඩු ශිෂ්‍ය පිරිසකට යොදවා ඇති මානව සහ භෞතික සම්පත් ප්‍රමාණය සාපේක්ෂව බැලීමේදී සම්පත් අපතේ හැරීමක් සහ ඵලාදායිතාව පහළ වැටීමක් වේ. ඒ සම්බන්ධ මේ වන විටත් විගණනයට ද ලක් වී ඇත.

බන්ධනාගාර ගතවන තරුණ පිරිස් මෙරට ශ්‍රමබලකායට එකතුකර ගනිමින් ඵලදායී පුරවැසියන් බවට පත්කිරීමටත්, යොදවා ඇති සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ගැනීම සඳහාත් මෙම සුනීත විද්‍යාලයේ ශිෂ්‍ය සංඛ්‍යාව ඉහළ නැංවීම කළ යුතු ය. ඒ සඳහා අධිකරණයෙන් බන්ධනාගාරයට යොමු කරන තරුණ වරදකරුවන් සෘජුවම මෙම වටරැක බන්ධනාගාරයට යොමු කිරීම සඳහා පියවර ගත යුතු වේ.

එහි කාර්ය සඳහා අධිකරණවල සියලු විනිශ්චයකරුවන් දැනුවත් කර අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කරන මෙන් කාරුණිකව ඉල්ලමි.

ජේ.එම්. තිලකා ජයසුන්දර,
ලේකම්.

පිටපත :- බන්ධනාගාර කොමසාරිස් ජනරාල්, බන්ධනාගාර දෙපාර්තමේන්තුව - අ.ක.ස.